මාධ්‍ය නිවේදන - අංක 29

මැතිවරණ කොමිෂන් සභාව

## පාර්ලිමේන්තු මැතිවරණය - 2020.08.05

### දේශපාලන ගුවන් ප්‍රචාර සඳහා රූපවාහිනී සහ ගුවන් විදුලි පහසුකම් ලබාදීම

1988 අංක 15 දරණ (සංශෝධිත) පනතින් සංශෝධිත 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 126 වැනි වගන්තිය අනුව නාමයෝජනා පත්‍රයක් භාර දී ඇති සෑම පිළිගත් දේශපාලන පක්ෂයකටම හෝ ස්වාධීන කණ්ඩායමකටම දේශපාලන ගුවන් විදුලි ප්‍රචාර පහසුකම් ලබාදිය යුතු වේ.

02. මෙම ගුවන් කාල වෙන් කිරීම සඳහා කුසපත් ඇදීම 2020.06.20 වන දින පෙ.ව. 10.00 සිට 12.00 දක්වා කොළඹ 07, මහාචාර්ය ස්ටැන්ලි විජේසුන්දර මාවතේ පිහිටි බස්නාහිර පළාත් සෞන්දර්ය නිකේතන ශ්‍රවණාගාරයේ දී සිදු කිරීමට ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව සහ ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව සමඟ ඒකාබද්ධව මැතිවරණ කොමිෂන් සභාව ක්‍රියා කරනු ලැබේ.

03. මේ සඳහා 2020 පාර්ලිමේන්තු මැතිවරණය වෙනුවෙන් වලංගු නාමයෝජනා පත්‍ර භාර දී ඇති පිළිගත් දේශපාලන පක්ෂවල ලේකම්වරුන්ට (හෝ ලිඛිතව බලය පැවරූ නියෝජිතයින්ට) සහ ස්වාධීන කණ්ඩායම්වල නායකයින්ට (හෝ ලිඛිතව බලය පැවරූ නියෝජිතයින්ට) සහභාගී විය හැකි බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මහින්ද දේශප්‍රිය
සභාපති, මැතිවරණ කොමිෂන් සභාව

මැතිවරණ කොමිෂන් සභාව,
සරණ මාවත,
රාජගිරිය.
2020.06.18